

රත්මලාන ගුවන් තොටුපොළ නාගරික ගුවන් තොටුපොළක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරෙමින් පවතින බව සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න මහතා පවසයි.

එහි ප්‍රගතිය පිළිබඳ සොයා බැලීම සඳහා අමාත්‍යවරයා පසුගියදා ගුවන්තොටුපොළ නිරීක්ෂණ චාරිකාවකට එක් විය.

මෙරටට පැමිණෙන පෞද්ගලික ගුවන්යානා 30%කින් වර්ධනය වී ඇති අතර එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් රත්මලාන ගුවන්තොටුපොළ නාගරික ගුවන්තොටුපොළක් බවට පත්කිරීමට කටයුතු කරන බව අමාත්‍යවරයා එහිදී පැවසීය.

මෙම ගුවන්තොටුපොළ මෙරට බිහි වූ මුල් ම ගුවන්තොටුපොළ වන අතර, අභ්‍යන්තර ගුවන් ගමන් මෙන් ම මානුෂික මෙහෙයුම් කටයුතු පවතින අවස්ථාවෙදී ඒ සඳහාද විශාල දායකත්වයක් මෙමගින් සපයන ලදී. රත්මලාන ගුවන්තොටුපොළෙහි ඇති තවත් වැදගත් අංගයක් වන්නේ ශ්‍රී ලංකාවට අයත් ගගන නාවික බල ප්‍රදේශය තුළට ඇතුළුවන සහ පිටවන ගුවන්යානා සඳහා ගගන නාවික සන්නිවේදන සේවා සපයන ප්‍රධාන මධ්‍යස්ථානය පිහිටීම බව අමාත්‍යවරයා එහිදී තවදුරටත් පෙන්වා දුන්නේය.

මෙරට ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙරට අභ්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීමට කටයුතු සැලසුම් කර ඇති බවත් දැනටමත් එහි විශාල ප්‍රගතියක් දැක ගත හැකි වන බවත් අමාත්‍යවරයා වැඩිදුරටත් එහිදී පැවසීය.

ECB